සැ. යු. - 2012.08.03 වැනි දින පළවූ අංක 1,770 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,771 - 2012 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2012.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 774 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 776 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 777 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2012 අංක 582

MOD/DEF/2/01/ARF/RF/104.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිළ ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2012 මාර්තු මස 20 වැනි දින සිට ලුතිතන් කර්නල් නිළයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

තාවකාලික ලුතිතන් කර්නල් ජයලත් බන්දුල වේරගම, පීඑස්සී ශ්‍රීලසසබ (නි/61499).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිළධාරී 2012 මාර්තු මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිතන් කර්නල් ජයලත් බන්දුල වේරගම, පීඑස්සී ශ්‍රීලසසබ (නි/61499).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-429

---

2012 අංක 583

MOD/DEF/2/01/ARF/RF/160.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිළධාරී 2012 ජූනි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

මේජර් මද්දුම ගාමිණී ප්‍රියන්ත දොඩංගොඩගේ, පීඑස්සී, ශ්‍රීලංසිරෙ (නි/62704).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

08-296

---

2012 අංක 584

MOD/DEF/2/01/ARF/RE/113.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිළ ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරී 2012 ජූනි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

තාවකාලික මේජර් වස්තු කංකානම්ගේ ජිනේන්ද්‍රරත්න කුමාර, ශ්‍රීලංසංබ (නි/63909).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිළධාරී 2012 මැයි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

මේජර් වස්තු කංකානම්ගේ ජිනේන්ද්‍රරත්න කුමාර, ශ්‍රීලංසංබ (නි/63909).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

08-428

2012 අංක 585

MOD/DEF/2/01/ARF/RE/144.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිළ ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිළධාරී 2012 ජූලි මස 30 වැනි දින සිට මේජර් නිළයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

තාවකාලික මේජර් සංග්‍රන්ගේ තුසිත පුබුදු සන්දනායක, ශ්‍රීලංඉ (නි/64929).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිළධාරී 2012 ජූලි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

මේජර් සංග්‍රන්ගේ තුසිත පුබුදු සන්දනායක, ශ්‍රීලංඉ (නි/64929).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-295

2012 අංක 586

MOD/DEF/02/01/ARF/RE/145.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිළ ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2012 ජුනි මස 30 වැනි දින සිට මේජර් (උපකරණ පාලක) නිළයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් (උපකරණ පාලක) පන්නල අප්පුහාමිලාගේ රත්නසිරි ශ්‍රීලයුවෙබ (නි/64279)

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිළධාරී 2012 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) පන්නල අප්පුහාමිලාගේ රත්නසිරි ශ්‍රීලයුවෙබ (නි/64279)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්‍ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-305

---

2012 අංක 587

MOD/DEF/2/01/ARF/RES/143.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිළධාරිණී 2012 ජුනි මස 01 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :-

ලුතිනන් ජයනි ධනංජා කන්දගේ, ඉසේබ (නි/67546).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

08-297

# රජයේ නිවේදන

**ඌව වෙල්ලස්ස, කොටබෝව, කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2012 වර්ෂය**

1964 ජූලි මස 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ වූ කොටබෝව වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. *කඳවුරු ප්‍රදේශය.*—කොටබෝවේ "දහමල් ඔය" නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුළත ප්‍රදේශය ඇතුළත් වේ.

02. *ගොඩනැගිලි ඉදිකිරීම්.*—මාගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2012.08.17 වැනි දින සිට 2012.09.01 වැනි දින දක්වා කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළඳසැලක් ඉදි නොකළ යුතු ය.

03. *යාචකයෝ.*— පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනකදී යාචකයින් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදාදීම ද නොකළ යුතුය.

04. *නෑම සහ සේදීම.*—කොටබෝවේ "දහමල්ඔය" නැමති පුරාණ තොටුපළේ සිට සැතපුම් භාගයක අර්ධ විශ්කම්භය ඇතුළත ප්‍රදේශය තුළ කිසිවෙකු විසින් දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම හෝ වාහන සේදීම නොකළ යුතු ය.

05. *වාහන.*—

05.01. මාගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසරයක් රහිතව මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (දහමල් ඔයෙන් නැගෙනහිරට) පැදවීම හෝ ඇතුළු කිරීම නොකළ යුතු ය.

05.02. කඳවුරට අයත් කඩබිම් ප්‍රදේශයේ වාහන නතර කිරීමට වෙන්කර ඇති රිය ගාල්වල හැර අන් කිසිදු ස්ථානයක වාහනයක් නතර කර නොතැබිය යුතු ය.

06. *කාවාඩි කඩ.*—මගේ හෝ මගේ බලයලත් නිලධාරියෙකුගෙන් ලබා ගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවෙකු විසින් කාවාඩි කඩ පිහිටුවනු නොලැබිය යුතුය.

07. වෙළඳාම

07.01 මගෙන් හෝ මගේ බලයලත් නිලධාරියෙකුගේ ලිඛිත අවසරයකින් තොරව කඳවුරු භූමිය තුළ තාවකාලික කඩ බදු දීම හෝ වෙන්දේසි කිරීම නොකළ යුතුය. තවද මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ප්‍රදේශය තුළ නියම නොකරන ලද ස්ථානයක එවැනි කටයුතු සිදු කිරීම කිසිවෙකු විසින් නොකළ යුතු ය.

07.02 පූජා පෙදෙස, මගී පාලමෙහි මාර්ගය හා කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුර අයුතු ලෙස ආක්‍රමණය කරන පරිදි යම් මඩුවක් තැනීම හෝ යම් ඉදිකිරීමක් කිරීම හෝ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් විශාල කිරීමක් නොකළ යුතුය. එකී ප්‍රදේශයන්හි සංචාරක වෙළඳාමද තහනම් ය.

07.03 මවිසින් හෝ මගේ බලයලත් නිලධාරියෙකු විසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතු ය.

07.04 යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් ගෙනයාමේ කාර්යය සඳහා සෑම ගොඩනැගිල්ලක, ඉදිකිරීමක හෝ ස්ථානයකම ප්‍රමාණයෙන් ඝණ අඩි 04 1/2කට අඩු නොවන කුණු බාල්දියක් සපයා තිබිය යුතුය. කුණු බාල්දියට කුණු දමන විට හා ඉන් ඒවා ඉවත් කරන විට හැර අන් සෑම විටම කුණු බාල්දිය පියනකින් වසා තැබිය යුතුය. තවද සෞඛ්‍ය කම්කරුවන් විසින් කුණු ඉවත ගෙන යෑම සඳහා නියම කරනු ලැබූ වේලාවන් හිදී ඒ භාජන ඒ ස්ථානවල පිටතින් තැබිය යුතුය.

07.05 විකිණීමට තබා ඇති සකස් කළ සියලු ආහාරපාන ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂාවන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතුය.

08. *සනීපාරක්ෂාව සහ මහජන සෞඛ්‍ය.*—ඒ කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක හැර කඳවුරු ප්‍රදේශය ඇතළත කිසිවෙකු විසින් මළ මූත්‍ර පහ නොකළ යුතු අතර, සලසා ඇති ස්ථානයක හෝ භාජනයක හැර කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිවෙකු විසින් ද්‍රව හෝ ඝණ කුණුකසළ කිසිවක් නොදැමිය යුතු ය.

මවිසින් දෙන ලද මෙම ආඥාවන් කිසිම තැනැත්තකු විසින් කඩ නොකළ යුතු ය.

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ,
කොටබෝව කුඩා කතරගම දේවාලයේ
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2012 ජූලි මස 23 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

08-314/2

---

**මඩ/මණ්ඩූර් ශ්‍රී කන්ද දේවාලයේ වාර්ෂික උත්සවය**

මඩ/මණ්ඩූර් ශ්‍රී කන්ද සුවාමි දේවාලයේ වාර්ෂික උත්සවය 2012.08.11 වැනි දින ප. ව. 8.00ට කොඩිය එසවීමෙන් ආරම්භ වී ඉන්පසු 2012.08.31 වැනි දින පෙ. ව. 10.00ට දිය කැපීමේ උත්සවය පැවැත්වේ. පසුව එදින 9.00ට කොඩිය පහත හෙළීමෙන් උත්සවය අවසන් වේ.

1949.05.27 වැනි දින අංක 5886 දරන ඡේදයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කොන්දේසි මෙම කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක වන බව මහජනතාවට දැනුම් දෙමි.

එස්. විල්පරෙත්තිනම්,
ප්‍රාදේශීය ලේකම්.

2012 ජූලි මස 18 වැනි දින,
පෝරතිවු පත්තු,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-414

**ඌව වෙල්ලස්ස, කොටබෝව, කුඩා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවය - 2012 වර්ෂය**

(175 වැනි අධිකාරය වන) වන්දනා ගමන් ආඥාපනත

ඌව වෙල්ලස්ස, කොටබෝව කුඩා කතරගම දේවාලයේ 2012 වාර්ෂික ඇසළ උත්සවය 2012.08.17 වැනි දින කප් සිටුවීමෙන් ආරම්භ වී 2012.09.01 වැනි දින අළුයම දිය කැපීමේ මංගල්‍යයෙන් නිමාවට පත්වන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. වන්දනා ගමන් ආඥා පනතේ විධිවිධාන අනුව 1964 ජූලි 24 වැනි දින අංක 14117 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

ඒ. පතිනාදන්,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති
සහ කොටබෝව කුඩා කතරගම දේවාලයේ
ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2012 ජූලි මස 23 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

08-314/1

---

**කන්දේ ඇල ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව**

2012 යල කන්නය

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේ ඇල ව්‍යාපාරයේ 2012 යල කන්නය සඳහා කන්න රැස්වීම 2012.15.22 දින කැප්පෙටිපොල වාරිමාර්ග කාර්යාලයේ දී පවත්වන ලදී. එහිදී පහත තීරණ ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 01. | වගා කරන බිම් ප්‍රමාණය | - | අක්කර 2300 |
| 02. | වගා කරන බෝගය | - | අර්තාපල්, මිශ්‍ර එළවළු |
| 03. | ප්‍රථම ජල මුරය නිකුත් කිරීම | - | 2012.07.05 |
| 04. | ප්‍රධාන ඇල, බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් ශුද්ධ කිරීම | - | 2012.05.25 සිට 2012.06.05 දක්වා |
| 05. | සී සෑම, බිම් සකස් කිරීම | - | 2012.06.30 ට පෙර |
| 06. | බෝග පැල සිටුවා අවසන් කිරීම | - | 2012.07.15 ට පෙර |
| 07. | අවසන් ජල මුරය නිකුත් කිරීම | - | 2012.10.15 ට පෙර |
| 08. | අස්වනු නෙලා අවසන් කරන දිනය | - | 2012.11.01 ට පෙර |
| 09. | අවශ්‍යතාවය අනුව ජල හිඟතාවයක් පැමිණි විට ජල මුර ක්‍රමය ක්‍රියාත්මක කිරීම | | |
| 10. | ඇලවේලි ශුද්ධ නොකිරීම සඳහා දඩ මුදල | - | දිනක වැටුප |
| 11. | දෙවන වර ඇලවේලි ශුද්ධ කිරීම | - | 2012 අගෝස්තු මස 02 සතියේ |

12. අනවසර ජලය ගැනීම අවම කිරීම සඳහා නියමිත වෙලාවට පමණක් ජලය ලබාගන්නා ලෙසත්, එය කඩ කරන අයට විරුද්ධව රු. 25,000ක දඩ මුදලක් හෝ දින 14ක් අත් අඩංගුවට ගැනීමට හැකිවන සේ නීති සකස් කර ගැනීම.

13. ජල හිඟතාවය යල කන්නයට බලපාන බැවින් කන්නේ අනවසර ගොවිතැන් කරන අයට 2013 සිට හෝ මහකන්නයේ පමණක් වගා කරන ලෙසට වැඩ පිළිවෙලක් සකස් කිරීම.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2012 අප්‍රේල් මස 25 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-431

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 843086.
අමරසිංහ ආරච්චිගේ දෝන ලූසී මේරි ජසින්තා මාලනී රංදෙනිය රංදෙනිය ආරච්චිගේ දොන් චමිල් තාරක රංදෙනිය.

2012 අප්‍රේල් මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් සහතික කරන ලද 2005.02.15 වැනි දින අංක 98 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් සහතික කරන ලද 2006.08.15 වැනි දින අංක 3281 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ අමරසිංහ ආරච්චිගේ දෝන ලූසී මේරි ජසින්තා මාලනී රංදෙනිය සහ රංදෙනි ආරච්චිගේ දොන් චමිල් තාරක රන්දෙනිය නොහොත් රන්දෙනිය ආරච්චිගේ දොන් චමිල් තාරක රංදෙනිය බන්ධනදායින් වශයෙන් හා රංදෙනි ආරච්චිගේ දොන් චමිල් තාරක රංදෙනිය නොහොත් රංදෙනිය ආරච්චිගේ දොන් චමිල් තාරක රංදෙනිය උකස්කරු වශයෙන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් පන් ලක්ෂ තිස් හතර දහස් හයසිය හැට පහයි ශත විසි එකක (රු. 55,34,665.21) මුදලක් 2012 මාර්තු මස 21 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස් පන් ලක්ෂ තිස් හතර දහස් හයසිය හැට පහයි ශත විසි එකක (රු. 55,34,665.21) මුදල හා 2012 මාර්තු මස 22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 50,05,000 ක මුදලක් සඳහා වාර්ෂිකව 15% බැගින් වූ පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වනවිට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 98 සහ අංක 3281 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර මාවිල්මඩ, ලේවැල්ල

පාර, දුටුගැමුණු මාවත, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කඳාන ගමේ පිහිටි කෝන්ගහවත්ත, සියඹලාගහවත්ත සහ කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 1984.12.22 වැනි දින සාදන ලද අංක 126 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ලොට් 1 සහ ලොට් 3 න් ද, (අඩි 8 ක පාරක් සඳහා වෙන් කිරීම) නැගෙනහිරට : ශාන්ත තෙරේසා මාවතෙන් ද, දකුණට : සහ බස්නාහිරට : එල්. ඒ. සිල්වා යන අයට අයත් ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළුව පර්චස් තිස් පහයි දශම නවයයි අටක් (අ. 0, රූ. 0, පර්. 35.98) විශාල ඉඩම් හා එහි තුළ පිහිටි සියලු දේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී 206/ 181 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම මැතක දී කරන ලද පිඹුරු අංක 3416 මැනුම අනුව පහත පරිදි විස්තර කර ඇත.

ඉහත කී කඳාන ගමේ පිහිටි කෝන්ගහවත්ත, සියඹලාගහවත්ත සහ කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් 2004.11.05 වැනි දින සාදන ලද අංක 3416 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 4 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි කඳාන ශාන්ත තෙරේසා මාවත වරිපනම් අංක 68/6 දරන දේපළට මායිම් එනම්, උතුරට : එම ඉඩමේ ලොට් 1 සහ ලොට් 3න් ද, නැගෙනහිරට : ශාන්ත තෙරේසා මාවතෙන් ද, දකුණට : සහ බස්නාහිරට : එල්. ඒ. සිල්වා යන අයගේ උරුමක්කාරයින්ට අයත් ඉඩමෙන් ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත පිඹුරු අංක 3416 හි නිරූපිත පරිදි පර්චස් තිස් පහක් (අ. 0, රූ. 0, පර්. 35) විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-330

---

### මහජන බැංකුව - හලාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.12.08 දිනැති අංක 3531 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් දොන් රෝෂන් ප්‍රමෝත් නිලාන්ත වීරසිංහ සහ මහමාලගේ නිලූකා සුදර්ශනී සිල්වා මිය යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හය ලක්ෂ විසිහය දහස් දෙසිය එකොළහයි ශත අසූ හත (රු. 626,211.87) ක මුදලක් අයවීමට ඇති බැවින් ද, 2010.02.16 වැනි දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් හය ලක්ෂ විසිහය දහස් දෙසිය එකොළහයි ශත අසූ හත (රු. 626,211.87) ක මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් හය ලක්ෂ විසිහය දහස් දෙසිය එකොළහයි ශත අසූ හත (රු. 626,211.87) ක මුදල අයකර ගැනීම සඳහා ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 3531 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පණත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දන් පත්තුවේ කිරිවැල්කැලේ නමැති ගමේ පිහිටි කිරිවැල්කැලේ වත්ත නමැති ඉඩමට එම්. ගුණසේකර බලයලත් මානක තැන විසින් වර්ෂ 1999.08.17 වැනි දින මැන කොටස් කර 1999.08.22 වැනි දින සාදන ලද අංක 2427 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : අංක මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් අංක 13 සහ ලොට් අංක 12 දරන කොටස් ද එකී පිඹුරේ 43 දරන කොටසක් ද, නැගෙනහිරට : අංක 2427 දරන පිඹුරේ ලොට් අංක 01 දරන කොටස ද, දකුණට : ආනවිලුන්දාව සිට නල්ලදරන්කට්ටුව දක්වා දිවෙන පාර ද, බස්නාහිරට : අංක මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් අංක 41 දරන පාර ද, එකී පිඹුරේ 34 සහ එකී පිඹුරේ 13 දරන කොටසක් ද, යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි, පර්චස් එකයි දශම පහයි බිංදුව (අක්. 01, රූ. 01 පර්. 01.50) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම පහයි බිංදුවයි නවයයි හතයි (හෙක්. 0.5097) ක් විශාල ඉඩමේ බිම් සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර්. 53/178 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමට ඇති ලොට් අංක 41 දරන පාර පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග පරවශතාවය ද මේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

08-349

---

### මහජන බැංකුව - හලාවත ශාඛාව

1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2010.09.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2009.07.29 දිනැති අංක 7592 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කොස්තාන් ක්‍රිස්පින් ජුඩ් රෝයි ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හත් ලක්ෂ තිස්තුන් දහස් අටසිය හැත්තෑ හතයි ශත හතර (රු. 733,877.04) ක මුදලක් අයවීමට ඇති බැවින්, 2009.12.31 වැනි දින සිට වර්ෂයකට 27% බැගින් රුපියල් හත් ලක්ෂ තිස්තුන් දහස් අටසිය හැත්තෑ හතයි ශත හතර (රු. 733, 877.04) ක මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29 L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් හත් ලක්ෂ තිස්තුන් දහස් අටසිය හැත්තෑ හතයි ශත හතර (රු. 733,877.04) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 7592 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පණත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළේ, ආනවිලුන්දන් පත්තුවේ, කෝට්ටපිටිය නමැති ගමේ පිහිටි කෝට්ටපිටිය කැලේ නමැති ඉඩමට ඒ. ජී. එස්. පරාක්‍රම, බලයලත් මානක තැන විසින් 1997.07.05 වැනි දින මැන සාදන ලද අංක 1495 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 06 දරන කොටසට මායිම්, උතුරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 05 දරන කොටස ද, නැගෙනහිරට : එච්. ජී. පීරිස් අප්පුහාමිගේ කුඹුරු ඉඩම ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් අංක 09 දරන කොටස ද, බස්නාහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 08 දරන පාරකට වෙන් කරන ලද බිම් තීරය සහ කැබලි අංක 07 දරන කොටස ද. යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතර (අක්. 0, රූ. 01, පර්. 04) ක් විශාල ඉඩමේ බිම් සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 154/184 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී කෝට්ටපිටිය නමැති ගමේ පිහිටි කෝට්ටපිටිය කැලේ නමැති ඉඩමට එස්. ශ්‍රීධරන් බලයලත් මානක තැන විසින් 2009.06.04 වැනි දින මැන සාදන ලද අංක 4156 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානකගේ 1495 ඒ දරන පිඹුරේ ලොට් අංක 05 දරන කොටස ද, නැගෙනහිරට : ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානකගේ 1495 ඒ පිඹුරේ ලොට් අංක 05 දරන කොටස සහ එච්. ජී. පීරිස් අප්පුහාමිට අයිති කුඹුර ද, දකුණට : ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානකගේ 1495 ඒ පිඹුරේ ලොට් අංක 09 දරන කොටස ද, බස්නාහිරට : ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානකගේ 1495 ඒ පිඹුරේ ලොට් අංක 07 සහ ලොට් අංක 08 දරන අඩි 10ක් පළල පාර යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් හතර (අක්. 00, රූ. 01, පර්. 04) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි එකයි එකයි දෙකයි නවය (හෙක්. 0.11129) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග වේ.

ඉහත ඉඩමට ප්‍රවේශ වීමට ඇති ඒ. ජී. එස්. බී. පරාක්‍රම බලයලත් මානකගේ අංක 1495 ඒ දරන පිඹුරේ ලොට් 08 දරන අඩි 10ක් පළල පාර පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග අයිතිය ද මේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

08-347

---

### මහජන බැංකුව - හලාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන
මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2006.07.06 වැනි දිනැති අංක 4360 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, දොන් රෙහාන් ලසන්ත වීරසිංහ සහ බර්ගර් ගොල්ලගේ ලිලියන් රෝස් දබරේරා යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාර ලක්ෂ හැත්තෑපන් දහස් හාරසිය තිස් නවයයි ශත හැත්තෑ අට (රු. 475,439.78) ක මුදලක් අයවීමට ඇති බැවින් ද, 2009.12.29 වැනි දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් හාර ලක්ෂ හැත්තෑපන් දහස් හාරසිය තිස් නවයයි ශත හැත්තෑ අට (රු. 475,439.78) ක මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් හාර ලක්ෂ හැත්තෑපන් දහස් හාරසිය තිස් නවයයි ශත හැත්තෑ අට (රු. 475,439.78) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 4360 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළේ ආනවිලුන්දන්පත්තුවේ, නල්ලදරන්කට්ටුව නමැති ගමේ පිහිටි රොමානිවත්ත නමැති ඉඩමට සර්වේ ජනරාල්වරයා වෙනුවට කොට්ඨාස භාර මැනුම් අධිකාරිවරයා විසින් සම්පාදිත වර්ෂ 1993.11.11 වැනි දින සාදන ලද අංක මු. පි. පු. 3332 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 09 දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක 08 දරන කොටස ද, නැගෙනහිරට : අඩි පාර ද, දකුණට : ලොට් අංක 26

සහ 25 දරන කොටස් ද, බස්නාහිරට : ලොට් අංක 10 දරන කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් දෙකයි, පර්චස් නවයයි දශම හතයි හතර (අක්. 0, රූ. 02, පර්. 9.74) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි දෙකයි හත (හෙක්. 0.227) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 135/102 හි ලියාපදිංචි වී ඇත. ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමට නැගෙනහිර මායිමින් දක්වා ඇති පාරේ මාර්ග අයිතිය ද මේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

08-348

---

## මහජන බැංකුව - මාතර උයන්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 "ඩී" වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 "ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂිනී විසින් සහතික කරන ලද 2008.04.10 දිනැති 105 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් උපාලි ජයන්ත ද ලැනරෝල් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 105 යටතේ රුපියල් දෙලක්ෂ තිස්හයදහස් පන්සිය හැටයි ශත අනූහතරක (රු. 236,560.94) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.11.18 වැනි දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් රුපියල් දෙලක්ෂ තිස්හයදහස් පන්සිය හැටයි ශත අනූහතරක (රු. 2,36,560.94) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 "එල්" වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් දෙලක්ෂ තිස්හයදහස් පන්සිය හැටයි ශත අනූහතරක (රු. 2,36,560.94) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 105 දරන උකස්කර යටත් එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, වැවහමන්දුව ගමේ පිහිටි කෙමනකඩමුල්ලෙවත්ත හෙවත් ජයසේකරගෙහේනවත්ත නමැති ඉඩමේ ඩී 9 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එම්. විදානගමාච්චි මහතා විසින් 2003.08.04 වැනි දින මැන සාදන ලද අංක 1283 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද අංක ඩී 9/1 දරන කැබැල්ලට එකී පිඹුර ප්‍රකාරව මායිම් උතුරට : මෙම ඉඩමේ ඩී 8 දරන අඩි 8ක් පළල පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක ඊ සහ එෆ් කැබැලි ද, දකුණට : 1283 ඒ පිඹුරේ අංක ඩී 9/2 දරන කැබැල්ල ද, බස්නාහිරට : ඩී 9/2 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් හතක් (අක්. 0, රූ. 0, පර්. 07) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි යනාදී සියලු දෑය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 464/63 හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
නූපේ, මාතර.

08-351

---

## මහජන බැංකුව - හලාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2006.11.16 වැනි දිනැති අංක 4951 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් මනමාලගේ උදේශ් චම්පික සිල්වා, දොන් ටියුලින් කොන්සි වීරසිංහ සහ මනමාලගේ ඩෙන්සිල් බෙනඩික් සිල්වා යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාර ලක්ෂ අසූතුන් දහස් තුන්සිය හැත්තෑ අටයි ශත තුනක (රු. 4,83,378.03) මුදලක් අයවීමට ඇති බැවින් ද, 2010.01.24 වැනි දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් හාර ලක්ෂ අසූතුන් දහස් තුන්සිය හැත්තෑ අටයි ශත තුනක (රු. 4,83,378.03) මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් හාර ලක්ෂ අසූතුන් දහස් තුන්සිය හැත්තෑ අටයි ශත තුනක (රු. 4,83,378.03) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 4951 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ආදායම් නිළධාරී කොට්ඨාසයට අයත්, කිරිවැල්කැලේ නමැති ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති අංක පිපිපු 158 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 34 දරන රජයේ ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉහත පිඹුර අනුව ලොට් අංක 13 දරන කොටස ද, නැගෙනහිරට : ඉහත පිඹුර අනුව ලොට් අංක 42 දරන කොටස ද, දකුණට : ඉහත පිඹුර අනුව ලොට් අංක 41 හා 35 දරන කොටස් ද, බස්නාහිරට : ඉහත පිඹුර අනුව ලොට් අංක 33 දරන කොටස් ද යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් බිංදුවයි පර්චස් හතර (අක්. 01, රූ. 00, පර්. 04) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි එකයි හතරයි අට (හෙක්. 0.4148) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගසකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 35/127 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී කිරිවැල්කැලේ නමැති ගමේ පිහිටි කිරිවැල්කැලේ නමැති ඉඩමට එම්. ගුණසේකර බලයලත් මානක තැන විසින් වර්ෂ 1995.07.21 වැනි දින මැන බෙදා වෙන්කර සාදන ලද අංක 286/95 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් අංක 13 දරන කොටස ද, නැගෙනහිරට : මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් අංක 42 දරන කොටස ද, දකුණට : මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් අංක 41 සහ 35 දරන කොටස් ද, බස්නාහිරට : මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් අංක 33 දරන කොටස ද.

යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් බිංදුවයි පර්චස් හතර (අක්. 01, රූ. 0, පර්. 04) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි එකයි හතරයි අට (හෙක්. 0.4148)ක් විශාල ඉඩමේ බිම් සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදි සෑම සියලුදේත් සමග වේ.

ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමට දකුණු මායිමින් දක්වා ඇති මු. පි. පු. 158 දරන පිඹුරේ ලොට් 41 දැක්වෙන පාරේ මාර්ග අයිතිය ද මේ සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

08-350

---

### මහජන බැංකුව

### 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2001.01.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පැට්‍රිෂියා ගුණරත්න මහත්මිය විසින් සහතික කරන ලද අංක 437 හා 1998.07.03 වැනි දින දරන උකස් බැදුම්කරය මත අය විය යුතු ගෙවීම් කිරීම දෙදෙනාම කොළඹ 11, 2 වැනි හරස් වීදියේ අංක 188 1/3 හි "ආලිෆ් ඉන්ටනැෂනල් ට්‍රේඩ්" හි මොහොමඩ් ජලල්දීන් මොහොමඩ් අෂාර සහ මොහොමඩ් ජලල්දීන් අසාම් කාදර යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 437 දරන බැදුම්කරය මත රුපියල් නවලක්ෂ හත් දහස් හයසිය අටයි ශත පණහක (රු. 9,07,608.50) මුදලක් මහජන බැංකුවට අය විය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් නවලක්ෂ හත් දහස් හයසිය අටයි ශත පණහක (රු. 9,07,608.50) එකී මුදල ද, 1999.07.08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හාරලක්ෂ හත් දහස් හයසිය අටයි ශත පණහක (රු. 4,07,608,50) මුදලක් මත වර්ෂයකට සියයට විසි පහ (25%) බැගින් තව දුරකටත් වූ පොළිය ද 200.02.01 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් පත් ලක්ෂයක (රු. 5,00,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් තව දුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 437 දරන උකස් බැදුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ පල්ලේගම්පහ කෝරළේ අකුරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංකුඹුර ගමේ පිහිටියා වූ ද "පන්සල්තැන්න එස්ටේට්" හි කොටසක් යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. එස්. සමරසිංහ විසින් සාදන ලද අංක 3793 හා 1990 ඔක්තෝම්බර් 11 සහ දෙසැම්බර් 10 වැනි දිනයන් දරන පිඹුරේ ලොට් අංක 19 ලෙස ලකුණුකොට නිරූපනය කර ඇත්තා වූ ද උතුරට : ලොට් අංක 20 ද, නැගෙනහිරට : ලොට් අංක 29 ද, දකුණට : ලොට් අංක 18 ද, බස්නාහිරට : අංකුඹුර සිට අලවතුගොඩට යන මහ පාර ද, මායිම්වන්නා වූ ද රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල වූ ද මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 561/222 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස, එහි බිම සහ එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (උතුර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ (උතුර),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

08-346

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : P020000001.

ණයකරුගේ සම්පූර්ණ නම : රාජගුරු මුදියන්සේලාගේ ජයතිලක.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩබ්ලිව්. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 691 හා 2006.10.09 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් විසි දෙමිලියන පන්සිය පන් දහස් අටසිය හැත්තෑ පහයි ශත හතලිස් තුනක (රු. 22,505,875.43) මුදලක් වර්ෂ 2012.04.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් නව මිලියන පන්සිය දහසක (රු. 9,500,000.00) මුදල ද වර්ෂ 2012.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දහතුන් මිලියන පන් දහස් අටසිය හැත්තෑපහයි ශත හතලිස් තුනක (රු. 13,005,875.43) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් විසි දෙමිලියන පන්සිය පන් දහස් අටසිය හැත්තෑ පහයි ශත හතලිස් තුනක (රු. 22,505,875.43) ද,

(2) එකී රුපියල් නව මිලියන පන්සිය දහසක (රු. 9,500,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 36% බැගින් වන පොළියක් 2015.05.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2012ක් වූ ජූනි මස 08 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කොටදෙනියාව (කලින් එරාබද්ද) හි පිහිටි දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නැමති ඉඩමට 2005.06.08 වැනි දින ටී. එන්. කාදර් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4002/05 පිඹුර ප්‍රකාර කැබලි අංක 01, 02, 03, 04, 05, 06, 07, 08, 09, 10, 11, 12 සහ 13 නමැති ඉඩම් කොටස්වලට මායිම්, උතුරට : එස්. ඒ. පී. අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : කේ. ජේම්ස් අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, දකුණට : ඩී. පී. ඩී. දිසානායක හිමිකම් කියන ඉඩම ද සහ බස්නාහිරට : කොටදෙණියාවේ සිට මීරිගම දක්වා දිවෙන ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසි හයක (අ. 1, රූ. 1, පර්. 26) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D223/04 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 02ට මායිම්, උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 4 ද, දකුණට : කැබලි අංක 3 ද සහ බටහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 03ට මායිම්, උතුරට : කැබලි අංක 2 ද, නැගෙනහිරට : කැබලි අංක 4 ද, දකුණට : කැබලි අංක 8 ද සහ බටහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම එකක (අ. 0, රූ. 0, පර්. 15.1) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 04ට මායිම්, උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 5 ද, දකුණට : කැබලි අංක 8 ද සහ බටහිරට : කැබලි අංක 2 සහ 3 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතක (අ. 0, රූ. 0, පර්. 17) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 05ට මායිම්, උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 6 ද, දකුණට : කැබලි අංක 8 ද සහ බටහිරට : කැබලි අංක 5 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ අටක (අ. 0, රූ. 0, පර්. 18) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 06ට මායිම්, උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 7 ද, දකුණට : කැබලි අංක 8 ද සහ බටහිරට : කැබලි අංක 6 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතක (අ. 0, රූ. 0, පර්. 17) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 07ට මායිම්, උතුරට : කැබලි අංක 1 ද, නැගෙනහිරට : කේ. ජේ. අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, දකුණට : කැබලි අංක 8 ද සහ බටහිරට : කැබලි අංක 6 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ අටයි දශම තුනක (අ. 0, රූ. 0, පර්. 18.3) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 10ට මායිම්, උතුරට : කැබලි අංක 8 ද, නැගෙනහිරට : කැබලි අංක 9 ද, දකුණට : ඩී. පී. දිසානායක හිමිකම් කියන ඉඩම ද සහ

බටහිරට ඃ කැබලි අංක 11 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20.0) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ඉහත කී කොටදෙනියාව හි පිහිටි ඉහත කී දෙල්ලහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට ඉහත කී අංක 4002/05 පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 11ට මායිම්, උතුරට ඃ කැබලි අංක 8 ද, නැගෙනහිරට ඃ කැබලි අංක 10 ද, දකුණට ඃ ඩී. පී. දිසානායක හිමිකම් කියන ඉඩම ද සහ බටහිරට ඃ කැබලි අංක 12 සහ 13 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම නවයක (අ. 0, රූ. 0, පර්. 20.9) වපසරියකින් යුතු මෙම ඉඩම, ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග වේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩබ්ලිව්. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද 691 හා 2006.10.09 වැනි දින දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරී.

දිනය ඃ 2012 ජුනි මස 08 වැනි දින.

08-416

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.